කොළඹ අධ්‍යාපන කලාපය
දෙවන වාර පරීක්ෂණය - 2012

සිංහල භාෂාව හා සාහිත්‍යය
(I කොටස)

10 වන ශ්‍රේණිය

පැය එකයි
One hour

නම/ විභාග අංකය .......................................................

- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- 1 සිට 40 දක්වා ප්‍රශ්නවලින් වඩාත් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරා ගන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයට හිමි ලකුණු ගණන 40කි.

---

- අංක 01 සිට 04 තෙක් ඇති ප්‍රශ්නවල තද කළු අකුරෙන් මුද්‍රිත කොටසේ ඇති අදහසට වඩාත් සමීප පිළිතුර තෝරන්න.

(01) **අහස් මාලිගා තැනීම** ඇතැමෙකුගේ සිරිතක් බව සීයා කිවේ ය.
1. නිවසක් තැනීම. 2. තීරණ ගැනීම.
3. අනවශ්‍ය ලෙස කාලය නාස්ති කිරීම. 4. නො කෙරෙන දෙයක් සැලසුම් කිරීම.

(02) ග්‍රාමීය ජනතාවගේ **මුල් බැස ගත්** ඇතැම් චාරිත්‍ර කිසිවිට ඉවත් කළ නො හැකිය.
1. චංචල වූ 2. මුල්ගල් තැබූ 3. සම්මත වූ 4. පුරුදු වූ

(03) ස්ව උත්සාහයෙන් ඉගෙන ගත් ඔහු, **ඉනිමඟට පයින් ගැසීම** කිසි දිනෙක නො කළේය.
1. අවශ්‍යතාව ඉටුකරගැනීම.
2. අවශ්‍යතාව ඉටු වූ පසු නොසැලකීම.
3. අවශ්‍යතාව ඉටු වූ පසු උදව් වූ දෙයට සැලකීම.
4. අවශ්‍යතාව ඉටු වූ පසු උදව් වූ දෙයට නොසැලකීම.

(04) එය **දුරුත්තේ දකින හීනයක්** බව ඔහු වැඩි දුරටත් පැහැදිලි කළේ ය.
1. ඉඳහිට පෙනෙන හීන 2. ගණන් නොගත යුතු දෙයක්
3. වැදගත් හීනයක් 4. ළඟදී ම පෙනෙන හීන

- **අංක 05 සිට 08 තෙක් ඇති ප්‍රශ්නවල හිස්තැන් වලට වඩාත් සුදුසු පදය තෝරන්න.**

(05) දහය පන්තියේ ........................... සිංහල භාෂාව හා සාහිත්‍ය විෂය ප්‍රිය කරන බව සිංහල විෂය උගන්වන ගුරුතුමිය දන්නී ය.
1. ශිෂ්‍යයෝ සියල්ලන් ම 2. ශිෂ්‍යයන් සියල්ලන් ම
3. ශිෂ්‍යයන් සියල්ලෝ ම 4. ශිෂ්‍යයෝ සියල්ලෙකු ම

(06) බොහෝ සතුරු ප්‍රහාරවල දී බිං ගෙවල් ජනතාවට රක්ෂාවරණය ........................
1. දෙයි. 2. දෙන්නාහ. 3. දෙති. 4. දෙන්නෙහු

(07) නායකයන් ආදර්ශවත් ........................ රට වැසියෝ ද ඔවුන් අනුගමනය කරති.
1. වෙයි නම් 2. වන්නෙහි නම් 3. වෙත් නම් 4. වූයේ නම්

(08) ........................ පංති වර්ජනයකට සූදානම් වෙති' යි ගුරුවරු බලධාරීන්ට දන්නුවෝ ය.
1. ශිෂ්‍යයෝ 2. ශිෂ්‍යයන් 3. සිසුහු 4. ශිෂ්‍යයෙක්

- අංක 09 සිට 10 යන ප්‍රශ්නවල දක්වෙන හැම වචනයක ම අක්ෂර වින්‍යාසය නිවැරදිව යෙදී ඇති වරණය තෝරන්න.

(09) 1. අභිලාස, ඖෂධාලය, සණ්ඨාව, සංශ්ලේෂණ
2. සෙවණැල්ල, ශීඝ්‍රගාමී, ප්‍රස්තාව පිරුළ, නිශ්ශබ්ද
3. ජෝෂ්ට, ගැහැණිය, සාම්ප්‍රධායික, භාර්‍යාව
4. ශිෂ්ඨාචාරය, උච්ඡාරණය, ලේඛම්, සම්භන්ධ

(10) 1. ස්ථූපය, වාර්තාව, විරෝද්‍ර, සමස්ත,
2. සම්භන්ධ, ප්‍රතිමාව, කුෂ්ඨ, කොට්ඨාසය
3. උෂ්ණ, කෲර, පරිගණක, නෂ්ඨාවශේෂ
4. ධර්මිෂ්ට, දුෂ්ට, වලාකුළ, විශ්මය

(11) පහත සඳහන් වාක්‍යවල හිස් තැනට වඩාත් සුදුසු පදය තෝරන්න.
1 කෘතිය පිළිබඳ දළ හැඳින්වීමක් එහි ........................ දක්වා ඇත.
1. ප්‍රස්තුතයේ 2. ප්‍රශ්වාසයේ 3. ප්‍රස්තාවනාවේ 4. ප්‍රස්තාරයේ

(12) භාෂා ........................ මගින් මෙවර නිර්මාණාත්මක කෘති කීපයක් එළි දැක්වීමට කටයුතු සලස්වා ඇත.
1. සංකීර්ණය 2. සංසරණය 3. සංස්ථාව 4. සංසදය

- අංක 13 - 14 තෙක් දී ඇති එක් එක් වාක්‍යයේ තද කළු අකුරින් යුත් කොටස්වල අදහස් දෙන තනි පදය තෝරන්න.

(13) හිතුමතයට තීන්දු ගන්නා පුද්ගලයින් නිසා ජන සමාජය විනාශ වී ගිය ආකාරය ඉතිහාස කතා තුළින් පැහැදිලි වේ.
1. අත්තනෝමතික 2. අවංක 3. ඒකමතික 4. හිතලු

(14) ලොව විවිධ නිර්මාණ බිහි වූයේ යමක් දැන ගැනීමට ඇති දැඩි ආශාව නිසාම ය.
1. විමර්ශනය 2. කුමන්ත්‍රණය
3. පාපොච්චාරණය 4. කුතුහලය

- පහත වැකියෙහි ඉරි ඇඳි පද අයත්වන වියරණ ගණය පිළිවෙළින් දක්වා ඇති වරණය තෝරන්න.

(15) <u>ලියවිලි</u> පරීක්ෂා කළ ඔහුට <u>කොග්ගල</u> නුදුරුව ඇති බව <u>යළි</u> <u>පසක්</u> විය.
1. නිපාත, තද්ධිත, සන්ධි, උපසර්ග
2. තද්ධිත, සන්ධි, උපසර්ග, නිපාත
3. තද්ධිත, සන්ධි, නිපාත, උපසර්ග
4. කෘදන්ත, සන්ධි, නිපාත, උපසර්ග

- පහත දී ඇති වාක්‍යයෙහි ඉරි ඇඳි අක්ෂරවලට යෙදී ඇති පිල්ලම් පිළිවෙළින් දක්වා ඇති වරණය තෝරන්න.

(16) නූල, සමඟ <u>බැ</u>ලූනය <u>ක්‍ර</u>මයෙන් <u>ඈ</u>තට යයි
1. පාපිල්ල, කෙටි ඇදපිල්ල, රේඵය, දික් ඇදපිල්ල
2. දික් පාපිල්ල, කෙටි ඇදපිල්ල, රකාරාංශය, දික් ඇදපිල්ල
3. දික් ඇදපිල්ල, කෙටි ඇදපිල්ල, ඇලපිල්ල, දික් ඇදපිල්ල
4. දික් පාපිල්ල, ඇල පිල්ල, රාකාරාංශය, දික් පාපිල්ල

(17) අකාරාදි පිළිවෙළට නම් යෙදී ඇති පද පේළිය තෝරන්න.
1. කාව්‍යශේඛරය, කෝකිල සන්දේශය, කව් ලකුණු මිණිමල, කුවේණි අස්න
2. භක්ති ශතක සන්නය, බුදුගුණ අලංකාරය, බුත් සරණ, බණකතා සාහිත්‍යය
3. කුමර ගී, කවිශික්ෂාව, කියවන නුවණ, ක්‍රියා විවරණය
4. සද්ධර්ම රත්නාවලිය, සිඛවළඳ හා සිඛවළඳවිනිස, සිදත් සඟරාව, සිය බස්ලකර

(18) මුලින් දී ඇති බහු අර්ථ පදයට නොගැළපෙන පද ඇතුළත් පද පේළිය තෝරන්න.
1. වත - තොරතුරු, මුහුණ, ව්‍රතය, වස්ත්‍ර
2. කඩ - වෙළෙඳ සල, කඩන්න, කැබැල්ල, රෙද්ද
3. උර - ළය, කර, වෙරළ, උපකාරය
4. දිව - දිව්‍ය, දුවලා, දූපත, ජිව්හාව

- **අංක 19 සිට 21 දක්වා ඇති ප්‍රශ්නවල මුලින් යෙදී ඇති පදයට සමාන තේරුමක් නොදෙන පදයක් ද ඇති පද පේළිය තෝරන්න.**

(19) සඳ - ඉන්දු, හිමරැස්, උළිඳු, නිශාකර, වහ්නි

(20) බිරිඳ - පියඹ, ඇඹෙණිය, ජනනී, පාද පරිචාරිකා

- **යුගල පදයක් ඇතුළත් නොවී ඇති පදය සහිත පද පේළිය තෝරන්න.**

(21) 1. අණපණත්, ආවටගියාට, මුදල්හදල්, තුටුපහටු
2. වැරවීරිය, අදිමදි, සුළමුළ, කුඩුකේඩු
3. දුරදිග, හතුරුමිතුරු, නම්ගම්, දුක්දොම්නස්
4. තරාතිරම, සිතාමතා, කඩමාලු, මස්මාළු

- **මුලින් දී ඇති පදයට විරුද්ධ අර්ථයක් දී ඇති පිළිතුර තෝරන්න.**

(22) 1. සතුට - ප්‍රහර්ෂය, තුට, සන්තුෂ්ටිය, ප්‍රමෝද
2. නිදහස් - නිවහල්, අපරාධීන, ස්වාධීන, අදීන
3. උත්සාහය - තැත, ආයාසය, යත්නය, දිරිය
4. මහත - රුදු, නැබල, උත්තුංග, කෘෂ

(23) මුලින් යෙදී ඇති අක්ෂර වර්ග කිරීමේදී නොගැළපෙන වරණය තෝරන්න.
1. අර්ධ අනුනාසිකාය - ඟ, ඦ, ඬ, ඳ, ඹ, ළ,
2. අන්තඃස්ථ - ය, ර, ල, ව
3. ඌෂ්මාක්ෂර - ශ්, ෂ්, ස්, හ්, (අ)ඃ
4. අනුනාසික්‍ය - ඞ්, ඤ්, ණ්, න්, ම්, (අ)ං

(24) "විදුහල්පති තුමා හොඳ දරුවන් අගය කරයි." යන වාක්‍යය කර්ම කාරක වාක්‍යයක් බවට හරවා ලියූ විට නිවැරදි වාක්‍යය වන්නේ,
1. විදුහල්පති තුමන් විසින් හොඳ දරුවන් අගය කරනු ලබති.
2. විදුහල්පති තුමා විසින් හොඳ දරුවෝ අගය කරන ලදහ.
3. විදුහල්පති තුමා විසින් හොඳ දරුවෝ අගය කෙරෙත්.
4. විදුහල්පති තුමාන් විසින් හොඳ දරුවෝ අගය කරනු ලැබුවේය.

(25) මුලින් දී ඇති වචන නිවැරදිව සන්ධි කර ඇති වරණය තෝරන්න.
1. යස + ඉසුරු = යසසිරු
2. අති + උදර = අත්‍යුදර
3. යථා + අවබෝධය = යථා බෝධය
4. සාහිත්‍ය + උත්සවය = සාහිත්‍යෝත්සවය

● **පහත සඳහන් කවියෙහි දක්වෙන හිස්තැන් සඳහා යෙදිය යුතු වචන අනුපිළිවෙළින් ඇතුළත් වරණය තෝරන්න.**

(26)

| | |
|---|---|
| ........... සුරා පිරූ | විතින් |
| සුරත් තඹුරු පෙති සෙ | ........... |
| පුවත් නොදැන ........... | ගතින් |
| ........... අයෙක් සුරා | මතින් |

1. නෙතින්, රැගත්, නටත්, බමන
2. රැගත්, නටත්, නෙතින්, බමන
3. නටත්, බමන, නෙතින්, රැගත්
4. රැගත්, නෙතින්, බමන, නටත්

(27) "සෑම හදකම **දහැමි** සිතිවිලි වගා වේවා"
මෙහි ඉරි ඇඳි පද්‍ය පාදය කුමන වියරණ වර්ගයට අයත් ද?
1. කෘදන්ත 2. විභක්ති 3. ක්‍රියා 4. තද්ධිත

● **දී ඇති ප්‍රකාශ වලින් වැරදි ප්‍රකාශය තෝරන්න.**

(28)
1. ග, ද, ඹ, යන සඤ්ඥක අකුරුවලට මුලින් බොහෝ විට යෙදෙන්නේ මූර්ධජ "ළ" කාරයයි.
2. "ර" කාරයට පසුව යංශය නොයෙදේ.
3. ච, ශ, ච, යන අකුරුවලට පෙර බෙහෙවින් යෙදෙන්නේ තාලුජ "ශ" ය.
4. "ර" කාරාන්ත ධාතුවලින් සෑදෙන න, නු, ප්‍රත්‍ය සහිත ක්‍රියා රූපවලදී යෙදෙන්නේ මූර්ධජ "ණ" කාරයයි.

(29) පහත කතා ව්‍යවහාරයේ ඇති යෙදුම ලේඛන ව්‍යවහාරයට හැරවූ විට නිවැරදි පිළිතුර වන්නේ කුමක් ද?
"ඇයි මයැණ්ඩි, අර අමුණගාව හැමරේ තියෙන්නේ කන්දරාවක් ම, මං ඒවායින් කොළ අහුරක් ඔක්කොට කරගෙන ගාටලයි මේ බැඳුම් කොරේ ඕං"
1. මාමා, අමුණු අසල අකුලේ බොහෝ තිබේ. මම ඉන් ටිකක් ඔඩොක්කුවට ගෙන, පැමිණ බැද ගත්තෙමි.
2. ඇයි, අයියේ, අමුණුට සමීප කැලෑ පෙදෙසේ රැසක් තිබේ. මම ඉන් කොළ කීපයක් ඔඩොක්කුවට ගෙන පැමිණ මෙලෙස බැද ගත්තෙමි.
3. ඇයි මාමේ, අර අමුණු ළඟ මූකලානේ ගොඩක් තිබේ. මම ඉන් කොළ අහුරක් ගෙන ඔඩොක්කුවට දමා හෙමින් පැමිණ මෙලෙස තෙලට දමුයෙමි.
4. අයියේ, අමුණ ළඟ තිබු කොළ ගෙන පිස, මෙලෙස ඔබට දෙමි.

(30) පද බෙද ලිවීම අතින් වඩාත් නිවැරදි ප්‍රකාශය වන්නේ කුමන් දැයි තෝරන්න.
1. එක් යුගයක එක් ලිපියකින් පමණක් භාෂාවක පරිණාමය පිළිබඳ පර්යේෂණයක් කළ නො හැකි බව ද සැලකිය යුතු ය.
2. උපමාව හා උපමේය යන දෙකම එකක්ලෙස සැලකීම රූපකාලංකාරයයි.
3. අවුවැසි සුළං නොබලා දිවාරෑ නොතකා ගොවියා ගොයම රැක බලා ගනියි.
4. දේශාභිමානි නිර්මාණ ඇසුරූ කිරී මෙන් රට ජාතිය පිළිබඳව හැඟීම් වර්ධනයවේ.

● **අංක 31 සිට 32 තෙක් ඇති එක් එක් පද යුගලයෙහි, දෙවන පදය, පළමුවැන්නට අර්ථයෙන් සමාන ද විරුද්ධ ද, අර්ථය වැඩි කරයි ද වෙනස් අර්ථයක් දේ ද යන්න තෝරන්න.**

(31) රුධිර - රුහිර 1. සමාන 2. විරුද්ධ 3. වැඩි 4. වෙනස්

(32) අපනයන - උපනයන 1. සමාන 2. විරුද්ධ 3. වැඩි 4. වෙනස්

- පහත සඳහන් ප්‍රකාශ එන පාඩමේ නම අනුපිළිවෙළට ලියා ඇති වරණය තෝරන්න.

(33) 1. "අඬන්න එපා, හොඳින් තේරුම් ගත්ත නම් ඒ ඇති"
2. "මේක උඩ තොවිල් නටන්නේ නැතුව හිටපං"
3. "මනුෂ්‍යයාට තිබෙන ඉතාම උසස් වෘත්තිය ගුරුකම බැව් මම තරයේ ම විශ්වාස කරමි."
4. "හිමියන් නැති වස්තු නම් රජ්ජුරුවනට පැමිණෙන්නේ යැ"

1. මිදි පොකුර, දිවිමඟට ඔවදන් මිණි, වන ගැබ තුළ චාරකා, උදුම්බරා
2. මඟ බලමින්, සතර බීර කතාව, අකුරු පුරාණය, උදුම්බරා
3. මිදි පොකුර, අකුරු පුරාණය, නැතලොවේ අත් රසඳුනා, සාහිත්‍යය
4. මිදි පොකුර, වන ගැබ තුළ චාරිකා, දිවි මඟට ඔවදන් මිණි, උදුම්බරා

- **34 සිට 35 තෙක් දී ඇති එක් එක් වාක්‍යයේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන වරණය තෝරන්න.**

(34) "විවිධ ගැටලු ඇති ආසියාතික රටවල එම ගැටලු වර්ධන කිරීමෙහිලා ඇතැම් රාජ්‍ය නොවන සංවිධාන වැදගත් කාර්ය භාරයක් ඉටු කරන බව රහසක් නොවේ"

1. ආසියාවේ තිබෙන විවිධ ගැටලුවලට රාජ්‍ය නොවන සංවිධාන සෘජුව වග කිව යුතු ය.
2. විවිධ ගැටලු ඇති ආසියාතික රටවල එම ගැටලු වර්ධනයට රාජ්‍ය නොවන සංවිධාන රහසින් උදවු කරයි.
3. ගැටලු සහිත ආසියාතික රටවල එම ගැටලු වර්ධනයට ඇතැම් රාජ්‍ය නොවන සංවිධාන දායක වන බව කවුරුත් දන්නා කරුණකි.
4. පවතින ගැටලු දෙගුණ තෙගුණ කිරීමට රාජ්‍ය නොවන සංවිධාන අනියම් ආකාරයකින් හවුල් වේ.

(35) - මහජන මුදල් කාබාසීනියා කරනවාට වඩා පොදු මාර්ග පහසුකම් ඇති කිරීම සංවර්ධන කාර්යයේ දී ගත් දූරදර්ශී පියවරකි.

1. විනාශවන මහජන මුදල් සංවර්ධන කාර්යයට යෙදවීම වැදගත් පියවරකි.
2. මහජන මුදල් විනාශ කරනවාට වඩා වාරිමාර්ග පහසුකම් ඇති කිරීම සංවර්ධනයේ දී දූරදර්ශී පියවරක් විය යුතු ය.
3. මහජන මුදල් පාරවල් සෑදීමට පමණක් ගත යුතු බවට මතයක් පවතී.
4. මහජන මුදල් වියදම් කරනවාට වඩා පොදු මාර්ග සඳහා යෙදවීම සංවර්ධන කාර්යයට ගත් විශාල උත්සාහයකි.

- **අංක 36 සිට 39 තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති වරණ හතර අතුරින් ව්‍යාකරණානුකූල ව නිවැරදි වාක්‍ය තෝරන්න.**

(36) 1. ළමයි පස් දෙනෙකු හිමගිර තරණයෙහි යෙදුණාහ.
2. දරුවෙක් පංති කාමරයේ සිටිති'යි මුරකරු පැවසීය.
3. බාල දක්ෂ නායකයෝ ගාලු මුවදොරට පැමිණ නැත.
4. කාන්තාවන් උදෙසා වෙන් කරන ලද හොඳ ආසන පොදු වාහනවල ඇත.

(37) 1. අමාවතුර ලියන ලද්දේ ගුරුළුගෝමීන් විසිනි.
2. මම නොහොත් පියා රැස්වීමට සහභාගි වෙමි.
3. මේ පාසලට පැමිණි ගුරුවරුන් කවර හු ද?
4. අම්මා ද අක්කා ද ඔබ ද පාසල් ගියෙමු.

(38) 1. කාන්තාවෝ අහර පිසද්දී හොරු රූපවාහිනිය රැගෙන ගියහ.
2. දරුවන් සැමද සැම විට ම අභ්‍යාසයේ යෙදීම මැනවි.
3. ගුරු උපදේශක සංගමයේ සාමාජිකයෝ අපේක්ෂා කරන්නේ මොනවා ද?
4. දේව දූතිකාවෝ වැනි දූරියන් අප අතර වෙති.

(39) 1. අලස දරුවකු ව සිටි නිමල් යහපත් ළමයෙකු වී උසස් ලෙස විභාගය සමත් විය.
2. අප හොඳින් ඒ වැඩය කළේ නම් දෙමව්පියන් සතුටු වෙති.
3. ඈ දක්ෂ නීතිඥවරියක වූ.
4. තාත්තා හෝ අම්මා හෝ මම හෝ රැස්වීමට සහභාගි වෙමු.

(40) ● **ඉරි ඇඳි වචන පද්‍ය භාෂා ව්‍යවහාරයට යෝග්‍ය වන ලෙස සකස් කළ විට නිවැරදි පිළිතුර වන්නේ මින් කුමක් ද?**

මහා පරාක්‍රමබාහු රජු රට ඒකච්ඡත්‍රකොට සූර්ය දිව්‍ය රාජ්‍යයාට ප්‍රදක්ෂිණා පවත්වා සිය ආඥා චක්‍රය දස දෙස පැතිර විය.

1. එක කොඩියට, සූර දෙව් රජුට, පැදකුණු, ආඥාසක
2. එක් සේසත් කොට, සඳ දෙව් රජුට, පැදකුණු, අණසක
3. ඒකච්ඡත්‍රකොට, සූරදෙව් රජුට, ප්‍රදක්ෂිණා, අණසක
4. එක්සේසත්කොට, සූරදෙව් රජුට, පැදකුණු, අණසක



v

කොළඹ අධ්‍යාපන කලාපය
දෙවන වාර පරීක්ෂණය - 2012

සිංහල භාෂාව හා සාහිත්‍යය
(II කොටස )

10 වන ශ්‍රේණිය

පැය දෙකයි
Two hour

නම/ විභාග අංකය ..................................................

* ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු ගණන 80 කි.

(01) අංක (i) - (x) දක්වා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

(i) ගීතයක හා පද්‍යයෙක පාද දෙකක් පහත දක්වා ඇත. ඒවා අතීත කාලයට හරවන්න.
(අ) "අරුණෝදයක දී දරුවා මුහුණ දක"
(ආ) "මාසා ඉල් මසේ උගුළයි අල බතලා"

(ii) පහත සඳහන් අක්ෂර දෙකෙන් පටන් ගන්නා වචන 1 බැගින් ලියන්න.
(අ) තෘ (ආ) දෙ

(iii) (අ) "අටු" ප්‍රත්‍ය යෙදෙන තද්ධිත පදයක් ලියන්න.
(ආ) පදයේ අර්ථය අනුව ම පවතින උපසර්ග පදයක් ලියන්න.

(iv) පහත පද්‍ය කොටස් දෙකේ ඇති උපමාලංකාරය හා රූපකාලංකාරය වෙන් කරන්න.
"රැගත් සුරා පිරූ විතින්
සුරත් තඹුරු පෙති සෙ නෙතින්"

"වැඳ ඔහු පද කමල
තමා ආ තතු කීය මුසිල"
(අ) උපමාලංකාරය (ආ) රූපකාලංකාරය

(v) කමත් භාෂාවේ දී පහත සඳහන් ප්‍රකාශවලට යෙදෙන නම් ලියන්න.
(අ) ගොයම් පෑගීම ආදී කටයුතු කෙරෙන තැන
(ආ) කපන ලද ගොයම් මිට

(vi) (අ) "බලති" යන්නේ අතීත කාල ඒක වචන ක්‍රියා පදය ලියන්න.
(ආ) "මුව දෙන පැටවා සොයයි" යන්න බහු වචනයට හරවන්න.

(vii) දළදා මාලිගාවේ පූජාක්‍රම හා බැඳී ඇති පහත සඳහන් පදවල අදහස ලියන්න.
(අ) අගසස් දනය (ආ) අඩුක්කුහැලි

(viii) පහත දක්වෙන කර්තෘකාරක වාක්‍යය කර්ම කාරකයට හරවා ලියන්න.
(අ) මල්ලී පොත බලයි.
(ආ) වෛද්‍යවරු රෝගීන් සුවපත් කළෝය.

(ix) "ගජ වියදමක්" යන යෙදුමෙන් විශාල වියදමක් යන්න අදහස් වේ. ඒ අනුව පහත යෙදුම්වල අදහස ලියන්න.
(අ) ගජරාමෙට (ආ) ගජ බින්න

(x) "රට දැය සමය සුරකිමු" යන්නෙහි පහත යෙදී ඇති වචන දෙකට සමාන වචන එක බැගින් ලියන්න.
(අ) දැය (ආ) සමය

(02) **පහත දැක්වෙන ව්‍යුහගත ඡේද අතුරින් එකක් තෝරා ගෙන වචන 250 කට නො අඩු වන සේ රචනයක් ලියන්න. මේ සඳහා සුදුසු මාතෘකාවක් ද යොදන්න.**

(අ) අතීත සෞභාග්‍යය වර්තමාන පරපුරට දායාදකොට දීමේ දී වැදගත් ස්ථානයක් හිමිවන්නේ පුරාවස්තුවලටයි. ගත වූ දින කීපය තුළ පුරාවස්තු රැසකට බරපතල හානි සිදු වී තිබේ. සමහර ඒවා සොරකම් කරගෙන ගොස් ය. සංරක්ෂණයට තිබෙන තැන්වල ඒවා සොරා ගත් විට මිනිස් වාසයෙන් තොර ඒවාට සිදුවන හානිය ගැන කවර කතා ද? මේ විනාශ වන්නේ අපගේ ශිෂ්ටාචාරය නොවේ ද? මේවා පිළිබඳව අලුතින් සිතන්නට සිදු ව ඇත.

(ආ) භාෂා කීපයක් දැන ගැනීමේ වටිනාකම පෙරට ත් වඩා දැනෙන්නේ අදට ය. අප ජීවත් වන්නේ දැනුම පදනම් කරගත්, දැනුමෙන් වැඩගන්නා, දැනුමෙන් දියුණු විය හැකි ලොවක ය. මේ නිසා විවිධ භාෂා දැන ගැනීමේ අවශ්‍යතාව පැන නැගී ඇත. ඒ තුළින් ළඟා කර. ගත හැකි සැපත සුළු පටු නොවේ.

(ඉ) ශ්‍රී ලංකාවේ ඛනිජ තෙල් සම්පත් ඇති බවට විටින් විට අසන්නට ලැබේ. එය ලැබුණහොත් දැනට ඇති ණය බරෙන් නිදහස් වීම පමණක් නොව අනාගතය පිළිබඳ සුභවාදී බලාපොරොත්තු ඇති කර ගත හැකි ය.

(ඊ) කුණාටු දිනවල බෝට්ටු පැදීම නුසුදුසු බව තාත්තා කීවේ ය. එය ගණන් නොගත් අප තිදෙනා බෝට්ටු පදිමින් සිටිය දී සුළඟට ගසාගෙන ගියේ ය. අනෙක් දෙදෙනාට වූයේ කුමක් දැයි මම නොදනිමි. මා සිටියේ පාළු දූපතක ය. මෙය ඔබට සිදුවූයේ යැයි සිතා නිර්මාණාත්මක රචනයක් ගොඩ නගන්න.

(03)" **පහත දැක්වෙන ඡේදය වචන 45 - 50 අතර ගණනකින් යුතු වන සේ සාරාංශ කොට ලියන්න. ඔබේ සාරාංශයේ ඇතුළත් වචන ගණන, උත්තරය අග ලියන්න.**

බුද්ධාගමේ ආභාසයෙන් මුල් අවධියේ සාහිත්‍යය වර්ධනය විය. එය බහුලව ආධ්‍යාත්මය දෙසට නැඹුරු වූවකි. මහායානය හා සංස්කෘත භාෂා සාහිත්‍යය පැතිරීම නිසා සාමාන්‍ය ජීවිතයේ ආශ්වාදයට සාහිත්‍යය කලා නැඹුරු විය. දකුණු ඉන්දීය හින්දු ඇදහිලි හා සාහිත්‍ය කලාවන් ද ඊට බලපෑවේ ය. බුදු සිරිත තේමා කරගත් ලේඛකයෝ, කාන්තාවන්, ස්වභාව සෞන්දර්ය, ආදරය වැනි අංගද කෘති වලට ඇතුළත් කළහ. කෝට්ටේ යුගයේ සන්දේශ සාහිත්‍ය නිසා කවිහු ආගමික බලපෑමෙන් නිදහස් ව ස්වාධීන නිර්මාණ කළහ. නායක්කර් පාලන සමයේ හින්දු නැටුම්, ගැයුම්, වැයුම්, රාජ සභාවට ද ඇතුළු විය.

එකළ බෞද්ධ හින්දු ප්‍රතිවිරෝධය සතුරු ආකල්පයක් නොගත්තේ ය. ජාතිවාදී ගැටුම් නොවීය. 1818 අරගලයේ විල්බාවේ රාළ පෙනී සිටියේ, "දොරේ සාමි" නම් දෙමළ නමිනි. එහෙත් යුරෝපීය පරිපාලනය හා සංස්කෘතිය සිංහලයන්ට මෙන් ම ද්‍රවිඩයන්ට ද සතුරු එකක් විය. යුරෝපීයයෝ දේශීයත්වය හෙළා දැක සිය සංස්කෘතියේ සුපිරි බව අඟවා එය බලෙන් පටවා සංස්කෘතික ආක්‍රමණයක් කළහ. මෙය සියතට ගත් මිෂනාරි වරු අධ්‍යාපනය තුළින් අනුකාරක වාදී උගතුන් තනා, තනතුරු දී සිය ග්‍රහණයට හසුකර ගත් හ. ඒ අවධියේ සිටි බුද්ධිමතුන් පවා දේශීයත්වය හා බද්ධ වීමට තැත් කළේ නැත.

(04) පහත සඳහන් කවි පන්තිය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

1. "පිනවන දුටු දන සැම
ගඟ ළඟ පිහිටි කදීම
තුරු පෙළ අවට සැදීම
යුත් සෙවණැල්

2. ගණ මේ කුලෙව් දිලීම
විහගුන් මත රැවි දීම
සුළඟින් පත් ලෙල දීම
ඇති හැමකල්

3. යන එන දන සැප සේම
එහි ඉඳ ගිම් සැන සීම
දස දිග අතු විහි දීම
තිබෙන විසල්

4. තුග තුර තුනු රුසි රෙන්ද
පළකර සක් දෙව් දුන්ද
පරසතු රුක විල සින්ද
නිබඳ දිසේ"

1. ඉහත කවිවලින් කුරුල්ලන් හා ජනතාව කරන කාර්යයන් එක බැගින් ලියන්න.
2. කවිවල යෙදී ඇති උපමා දෙකක් ලියන්න.
3. තරුණ රූප ශ්‍රීයෙන් ශක්‍ර දිව්‍ය රාජයාගේ ස්වාභාවය ප්‍රකාශ කරන්නේ කුමක් ද?
4. මෙහි කියවෙන වස්තුවෙහි විශාලත්වය පෙන්වන පද්‍ය පාදය උපුටා දක්වන්න.
5. "පිනවන" "නිබඳ දිසේ" යන පද දෙකේ තේරුම ලියන්න.

(2 × 5 = 10)

(05) i. ශීඝ්‍රයෙන් පැතිරී යන ඩෙංගු උණ රෝගය නිසා ඔබගේ පාසලේ භූමිය හා ඒ අවට ශුද්ධ පවිත්‍ර කළ යුතු ව ඇත. ඔබ එහි ඩෙංගු මර්දන මහජන කමිටුවේ ලේකම්වරයා යැයි සිතා අත් පත්‍රිකාවක් සකසන්න. ඩෙංගු රෝගය බෝවෙන ආකාරය, සිදුවන හානිය, පාසල් භූමිය පිරිසිදු කළ යුත්තේ ඇයි? ගෙන ආ යුතු උපකරණ යන කරුණු ඔබ සකස් කරන අත් පත්‍රිකාවෙහි අඩංගු විය යුතුය. (වචන 100 ක් පමණ සෑහේ.)

නැතහොත්

පාසලක පැවැති සිංහල භාෂා හා සාහිත්‍ය තරගාවලියේ තෑගි බෙදා දීමේ උත්සවයක් පිළිබඳ තොරතුරු ඇතුළත් කෙටි සටහනක් පහත දක් වේ. ඒ ඇසුරෙන් වචන 125 ක පමණ පුවත්පත් වාර්තාවක් සකසන්න.

| | | |
|---|---|---|
| දිනය හා වේලාව | - | 2012 ජුලි 12 සවස 2.00 |
| ස්ථානය | - | කළුතර නෙළුම් පුර මහා විද්‍යාලය |
| සංවිධානය | - | විද්‍යාලයීය කලා සංගමය |
| විශේෂ දේශනය | - | මහාචාර්ය උපුල් සේනානායක |
| මුලසුන | - | විදුහල්පති අසෝක ලියනගේ |
| සහභාගීත්වය | - | අවට පාසල්වල දරුදැරියන්, දෙමාපියන් |

කොළඹ අධ්‍යාපන කලාපය
දෙවන වාර පරීක්ෂණය - 2012

සිංහල භාෂාව හා සාහිත්‍යය
(III කොටස )

10 වන ශ්‍රේණිය

පැය දෙකයි
Two hour

නම / විභාග අංකය ......................................................

- ※ උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
- ※ 1, 2, 3, 4 යන ප්‍රශ්නවලටත් 5, 6, 7 ප්‍රශ්නවලින් එකකටත් බැගින් ප්‍රශ්න 5 කට පමණක් පිළිතුරු සපයන්න.
- ※ මෙම ප්‍රශ්න පත්‍රයට හිමි මුළු ලකුණු ගණන 80 කි.

---

(01) (i) සිට (x) තෙක් ඇති සියලු ම අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න.
කිසියම් අනුකොටසකට උත්තර නොලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

(i) "මං මොනව කොරන්ඩ දැ දුවේ"
(අ) මෙම ප්‍රකාශය හා සබැඳි අවස්ථාව කුමක් ද?
(ආ) මෙම කොටස උපුටා ගත් මුල් පොත නම් කරන්න.

(ii) "එසේ නොවදළ මැනැව, මම නුඹ වහන්සේ ගැති නො වෙම් දැ"
(අ) මෙම ප්‍රකාශය කිරීමට හේතු වූ කරුණ කුමක් ද?
(ආ) මෙහි 'මම' යනුවෙන් හඳුන්වා ඇති අයගේ නම ලියන්න.

(iii) "එවන මෙ සඳැ තැවුලිය ළැව් ගිනි සෙ ........ වලා
කුමන සැප ද වින්දේ හිමි සමග ........ වලා"
(අ) මෙම කවියේ මුල් පද දෙක සම්පූර්ණ කරන්න.
(ආ) මෙහි යෙදී ඇති උපමාවෙන් ඇඟවෙන සිදුවීම කුමක් ද?

(iv) "එකක්වත් මට හරියට ඇහුණෙ නැහැ. ආයෙත් කියාපන්"
(අ) මෙහි හරියට ඇහුණේ නැති ප්‍රකාශය කුමක් ද?
(ආ) ඉහත ප්‍රකාශය ශ්‍රවණය කළේ කවරකු ද?

(v) පහත සඳහන් අදහස්වලට ගැළපෙන කවි පදය, නිර්දිෂ්ට කෘතිවලින් තෝරා ලියන්න.
(අ) අකුණු ගසන හඬින් ගස් වැල් බියවෙයි.
(ආ) දර්ශනය වූ ඉතා ශීතල දිය ඇළි වල සෙල්ලම් කර

(vi) (අ) "අසන්නාගේ සිත් පහදවා, ස්වර්ග මොක්ෂ සැප ලබන ලෙස සිත් අදනා සිංහල බසින් පද බැඳ කියමි" යනුවෙන් කතුවරයා කළ රචනය කුමක් ද?
(ආ) "මඟුල් ප්‍රස්තාව" නාට්‍ය කුමන නාට්‍ය ගණයකට අයත් ද?

(vii) "බිසෝවරුනි! මෙ තෙක් දවස් මට තෙපි හැම දෙන බොහෝ වෙහෙසුම් කළෝ වේ ද?
(අ) මෙම ප්‍රකාශයෙන් කියැවෙන ව්‍යාධියේ නම කුමක් ද?
(ආ) ඉහත ප්‍රකාශය ඇතුළත් ග්‍රන්ථය ලිවීමට ආරාධනා කළේ කවු ද?

(viii) පහත සඳහන් ග්‍රන්ථ ලියන ලද ලේඛකයන් නම් කරන්න.
(අ) ගංගාවේ ගීතය (ආ) කාව්‍ය ශාස්ත්‍රය

(ix) "ඔහේ දන්නවානේ මට ඉඩම් තියෙන්නේ ඔහේලගේ මායිම ළඟ බව"
(අ) මෙහි "ඔහේ" යනුවෙන් හඳුන්වන්නේ කවු ද?
(ආ) මායිම ළඟ පිහිටි ඉඩමේ නම ලියන්න

(x) පහත සඳහන් සාහිත්‍ය කෘති ලිය වී ඇතැයි සැලකෙන සාහිත්‍ය යුග සඳහන් කරන්න.
(අ) ජීවක කථා වස්තුව (ආ) සඳකිඳුරුදා කව

(02) **පහත දැක්වෙන ගද්‍ය හා පද්‍ය පාඨවල තද කළු අකුරින් මුද්‍රිත කොටස්වල අර්ථය වෙන් වෙන් ව ලියන්න. ඉන් පසු මුළු කොටසේ ම අර්ථය ලිහිල් බසින් ලියන්න.**

i. "සිටු දේවීන්ට ගැට ගැසී ගිය තැන් පෑ ගැට උනා හැර නැවත බඩවැල ඇතුළෙහි ලා **බැහැනිගෙන** ඖෂධ ගල්වා සිටාණන් **ස්ථා මිහයෙන් උනා** යානෙහි සතපා රස උළු කැන් පොවා තුන් දවසින් ගොඩ නැගුහ."

ii. "පදමට වෙරළු මිණි කැට පුණු විසුළ හැඩ
**ජෝතිය ලැගුම් ගත්** ලා තණ පිටිය උඩ
නැහැ පුඩු මහත්කොට මී ගොන් මුළුව නැඩ
කිම්දෙති **නැවුම් පුස්බෙහි** වෙල් කුඹුරු බඩ"

iii. "කිරි ටින් එහෙකට කාසි මසි උණා ඉතුරු උණේ සත හතළිහ ද කොහෙ ද, ඒක තමා දැං මං **වසගත්තුවට** තියෙන්නේ, අම්මා **කනිපින්දම්** කීවේ බැරිම තැන."

iv. "**උපුල් කඩා ගෙනැ** කනලා සුපුල් වන
ළකල් කුසුම් දම් කරලා එකල් වන
නිමල් මෙ නුඹ සහ **විදි සැප විපුල්** වන
සිහිල් සෙවණැ උන් මට මේ තැවුල් වන"

- **3, 4 ප්‍රශ්නවලට අයත් එක් පිළිතුරක වචන 125 ක් පමණ තිබීම සෑහේ.**

(03) i. ඉලක්කයක් අනුව කටයුතු කිරීමෙන් සිය අරමුණ කරා යා හැකි ආකාරය.

ii. එම අරමුණු කරන ගමන් කිරීමට ගුරුවරයාගේ කාර්ය භාරය වැදගත්වන ආකාරය ජීවක කතා වස්තුවෙන් දක්වා ඇති අන්දම එකිනෙකට උදාහරණ දෙක බැගින් වත් දෙමින් පැහැදිලි කරන්න.

නැතහොත්

වැස්ස පද්‍ය පන්තිය තුළින්

i. වැස්ස නිසා කවියා ලැබූ සතුට ප්‍රකාශ කිරීම.
ii. විවිධ කාව්‍ය උපක්‍රම භාවිත කිරීම, නිසා සාර්ථක කවිපන්තියක් වී ඇති ආකාරය එකිනෙකට උදාහරණ දෙක බැගින් දෙමින් විස්තර කරන්න.

(04) i. ඉගෙනීමට දැඩි ආශාවක් දක්වන දැරියකගේ සුවිශේෂි ලක්ෂණ
ii. අභියෝග හමුවේ නොසැලී කටයුතු කරන දිරිය මවකගේ ලක්ෂණ
iii. "අපටත් දවසක ඉර පායාදෝ" කෙටි කථාව තුළින් පෙන්වා ඇති ආකාරය උදාහරණ දෙක බැගින් ගෙන විස්තර කරන්න.

නැතහොත්

i. කිඳුරියගේ විරහ වේදනාව පෙන්වීම සඳහා පරිසරය උදව් කරගත් ආකාරය
ii. කවි පන්තිය සාර්ථක එකක් බවට පත් කර ගැනීම සඳහා යොදාගෙන ඇති කාව්‍ය උපක්‍රම "කිඳුරුවලප" තුළින් දක්වා ඇති ආකාරය උදාහරණ දෙක බැගින් දක්වමින් පැහැදිලි කරන්න.

(05) බුද්ධිමත්ව කටයුතු නොකිරීමෙන් මිනිසුන් ඇති කර ගන්නා ගැටුම්කාරී ස්වභාවය නාට්‍ය කරුවා උපහාසයෙන් යුතුව පෙන්වා ඇති අන්දම "මඟුල් ප්‍රස්තාව" නාට්‍ය ඇසුරෙන් උදාහරණ දෙමින් පැහැදිලි කරන්න.

(06) ජීවක කතා වස්තුව එකල පැවති සමාජ පරිසරය මැනවින් නිරූපණය කරන කතාන්දරයකි. අදාළ නිදසුන් තුනක්වත් ගෙනහැර දක්වමින් විමසන්න.

(07) තම දයාබර සැමියාගේ හදිසි වියෝව නිසා ඕනෑම ගැහැනියක් කටයුතු කරන ආකාරයෙන් "කිඳුරු වලප" පද්‍ය පන්තිය ඉදිරිපත් කොට ඇත. යෝග්‍ය උහරණ තුනක් වත් දෙමින් පැහැදිලි කරන්න.

ලෝකස්සුම